# 2018.07.10 වන දින යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවති හයවන සැසි වාරයේ සිව් වන මහා සභා රැස්වීම් වාර්තාව

ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව වේලාව - පෙරවරු 9.00

2018.07.10 වන දින පැවති ගරු මහා සභා රැස්වීම සදහා සහභාගි වූ ගරු මන්ත්‍රිතුමන්ලාගේ නාම ලේඛනය

1.ගරු සභාපතිතුමා - කේ.ඩි.වසන්ත මහතා
2.ගරු උපසභාපතිතුමා - ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.එම්.සත්‍යානන්දන් මහතා
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා
5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මහතා
6ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මහතා
7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා
8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ඩබ්ලිව්.කතිකා දමයන්ති මහත්මිය
9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -කේ.කේ.නිමල් විජේසූරිය මහතා
10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එන්.කේ.නිමල් කුමාරසිරි මහතා
11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.ජී.තිලකරත්න මහතා
12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩි.ඒ.එල්.සුනිල් දෙයියාගල මහතා
13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි - පි.ඩබ්ලිව්.අමිල හේමන්ත විජයසිරි මහතා
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එම්.ඩබ්ලිව්.හිමන්ත අජිත් බණ්ඩාර මහතා
15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මහතා
16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩි.පි.ප්‍රේමසිරි ජයලත් මහතා
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ජී.ආර්.ලාල් නිශාන්ත මහතා
18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -ඩබි.ජී.සරත් ප්‍රේමසිරි මහතා
19.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එස්.සුදර්ශන් මහතා
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ටි.පි.ජී.ඩබ්ලිව්.කිර්තිසේන අල්විස් මහතා

21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා කුමාරි මෙනවිය
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.මධුෂිකා ප්‍රශාදනි ජයසිංහ මහත්මිය
23.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි -එම්.ඩී.පී.ඥානවති මහත්මිය
24.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ටී.ඉමල්කා සංජීවනි මහත්මිය
25.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - බී.ජී.සීතා රංජනි මහත්මිය
26.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි -ඒ.පී.ඩබ්ලිව්.එම්.පී.ඩයනා උදයංගනි මෙනවිය
27ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා
28.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - කේ.කමල්රාජ් මහතා

## 2018.06.12 වන දින පැවති ගරු මහා සභා රැස්වීම සදහා සහභාගි වූ නිළධාරින්

1.ලේකම් - ආර්.එම්.ඒ.රත්නායක මහත්මිය
2.සංවර්ධන නිළධාරි - ආර්.එච්.සී.නිසාන්ති මහත්මිය

## සභා ගර්භයෙන් පිටව ගිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිතුමන්ලාගේ නාම ලේඛණය

01..ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා ප.ව 1.30 ට පමණ
2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්ලිව්.කතිකා දමයන්ති මහත්මිය ප.ව.1.30 පමණ
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.මධුෂිකා ප්‍රශාදනි ජයසිංහ මහත්මිය ප.ව.1.30 පමණ

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව පැමිණ සිටි සියළුදෙනා ආගම සිහිකිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත්ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙ.ව.9.00 ට පමණ ආරම්භ කරන ලදි.

## ගරු සභාපතිතුමා

අද දින පැවැත්වෙන මහා සභා රැස්වීම සදහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී තුමන්ලා හා ගරුමන්ත්‍රී තුමියන්ලා ආදරයෙන් ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා. ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයත්, මාධ්‍ය ආවරණය සදහා පැමිණි මාධ්‍ය නියෝජිත තුමන්ලාත් මා ආදරයෙන් ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.අද දින පැවැත්වෙන ගරු මහා සභා රැස්වීමට අදාළ සියළුම ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකර ගැනිම සදහා ඔබ සැමගේ සක්‍රිය දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරනු ලබනවා.

## *අ. පසුගිය මහාසභාවේ රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම*

### ගරුසභාපතිතුමා

2018.06.12 වන දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සළකා එහි කිසියම් නිවැරදි කිරීම් හෝ සංශෝධන නොමැතිනම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරීම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් මා මෙම සභාවට දන්වා සිටිනවා..

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.නිමල් විජේසූරිය මහතා

ගරු සභාපති තුමනි, ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලද 2018.06.12 වන දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව නිවැරදි බවත් සභා සම්මත කිරීම සුදුසු බවත් මම යෝජනා කරනවා.

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මහතා

ගරු සභාපති තුමනි, ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

### ගරු සභාපති තුමා

නිවැරදි කිරීම් හෝ විරෝධතා රහිතව 2018.06.12 වන දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව සභා සම්මත වූ බව ගරු මහා සභාවට නිවේදනය කරනවා.

*ආ. ගරු සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදනය -*

**1.**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් 2018.07.05 දිනැති අප වෙත එවා ඇති ලිපිය සම්බන්ධවයි. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතනවල සභිකවරුන් සදහා විශේෂ සහතිකපත්‍ර පාඨමාලාවක් සංවිධානය කර තිබේ.මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සදහා

දේශපාලනය හා පළාත් පාලනය පිළිබඳ මූලික සංකල්පය හා භාවිතයන් පිළිබඳවවිධිමත් අවබෝධයක් ලබා දිමයි.

*කාලය මාස 04යි.සතියට දින 01යි.සම්පූර්ණ දින 12 යි.

*පාඨමාලා ගාස්තුව රු.30000 යි.

## ඇ. සභාව අමතා එවා ඇති ලිපි සන්දේශ ඉදිරිපත් කිරිම -

## ගරු සභාපතිතුමා

**1.**නෙළුවතුකන්ද ගමේ නිදැල්ලේ යන ගවයින් සම්බන්ධයෙන් නෙළුවතු කන්ද ගොවි සංවිධානයේ ලේකම් විසින් 2018.07.04 දිනැති අප වෙත එවා ඇති ලිපිය ගරු මහ සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරමි.

2.නිවසක් තනා ගැනිම සදහා රජයේ ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලා මල්වත්ත පාර ,කිතුල්ගල පදිංචි බි.ඩබ්ලිව් අචින්තා සෙව්වන්දි මහත්මිය විසින් 2018.07.02 දිනැති අප වෙත එවා ඇති ලියවිල්ල ගරු මහ සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරමි.

3.ඉතා අබලන් තත්වයේ පවතින කොටුන්න ජනපදය මාර්ගය සකස් කර ගැනිම සහ බෝක්කුවක් සාදා ගැනිම සදහා වැලිහෙලතැන්න,උඩජනපදයේ පදිංචි ඩි.ජී.මහේෂ් කුමාර මහතා විසින් 2018.06.08 වන දින අප වෙත එවා ඇති ලියවිල්ල ගරු මහා සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරමි.

(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ -

## ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රිතුමා,ඔබ තුමාගේ ප්‍රශ්ණ එකින් එක මේ අවශ්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

## ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එස්.ආර්.ලාල් නිශාන්ත මහතා

1.ගරු සභාපතිතුමනි,
1.2018. 05.22 වන දින ප්‍රාදේශිය සභා භූමියේදි සභාව සතු භාණ්ඩ වෙන්දේසියක් පැවැත් වූවේද?

## ගරු සභාපතිතුමා

2018.05.22 වන දින යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ගරාජ් භූමියේදී සභාව සතු ආක්‍රිය වී ඇති වාහන හා යන්ත්‍රෝපකරණ වෙන්දේසියක් පවත්වන ලදී.

එදින වෙන්දේසි කිරීමට අදාල වාහන හා යන්ත්‍රෝපකරණ ලැයිස්තුව පහත පරිදි වෙයි.

| අනුඅංකය | වාහන හා යන්ත්‍රෝපකරණ | ප්‍රමාණය |
|---|---|---|
| 01 | SG GH 7158 ටේලර් රථය (යකඩසඳහා) | 01 |
| 02 | SG AT 8785 ත්‍රිරෝද රථය | 01 |
| 03 | SG GH 3599 යතුරු පැදිය | 01 |
| 04 | ලෙලෙන තලන යන්ත්‍රය | 01 |

2016.12.31 දිනට පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ආක්‍රිය වී ඇති වාහන හා යන්ත්‍රෝපකරණ මෝටරථ පරීක්ෂක මහතාගේ වාර්තා මත කටයුතු කිරීමට නිර්දේශ කරනු ලදී.

ඒ අනුව 2017.04.03 දිනැති ලිපිය මගින්වාහනවල තත්ත්ව වාර්තා ලබා ගැනීමසඳහාමෝටරථ පරීක්ෂකමහතාවෙත යොමු කළඅතර 2017.05.18 වන දින ආදාල වාහන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෝටර් රථ පරීක්ෂක මහතා විසින් ඉහත සඳහන් වාහන අලුත් වැඩියා කිරීම ඵලදායී නොවන බවට වාර්තා කරන ලදී.

## ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා

II.එම වෙන්දේසිය සදහා යොදා ගත් නිර්ණායක මොනවාද?

## ගරු සභාපතිතුමා

I. එකී වාර්තාව පදනම් කරගෙන 2015.07.10 දිනැතිව මුදල් ආමාත්‍යාංශයේ 02/2015 රාජ්‍ය මුදල් චක්‍ර ලේඛනයේ 05 වන වගන්තියේ විදිවිදාන පරිදි මෝටරථ පරීක්ෂකවරයා ද ඇතුළුව පත්කර ගත් කමිටුව මගින් මිල ගණන් තක්සේරුකර ඇත.

2017.11.15 දිනැති 2783 අංක දරණ ලේකම් තීරණය අනුව 2018.01.22 දිනැතිව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මෙම වෙන්දේසිය සඳහා ලබාගෙන ඇත.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන ගරු සභාපති තුමාගේ අනුමැතිය ලබාගෙන 2018.05.04 දිනැතිව ත්‍රෛභාෂිකව පුවත්පත් දැන්වීම් පලකර 2018.05.22 වන දින වෙන්දේසිය ප්‍රාදේශීය සභා භූමියේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා

III.ප්‍රසම්පාදන කමිටුව දැනුවත් කළාද?

## ගරු සභාපතිතුමා

නැත

සභා අරමුදල් යොදවා ඉතාම සුදුසු ආකාරයට භාණ්ඩ සේවා හෝ වැඩ ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශක සංග්‍රහයේ 2.5 හි ප්‍රසම්පාදන කමිටුවල වගකීම් සහ කාර්යභාරය දන්වා ඇති අතර මෙවැනි වෙන්දේසියක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව දැනුවත් කිරීමේ නෛතික අවශ්‍යතාවයක් නැත.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා

IV.ඒ සදහා මිල ගණන් තක්සේරු කලාද?

## ගරු සභාපතිතුමා

I. ඔව්

තක්සේරු කළ ආකාරය දෙවෙනි ප්‍රශ්නයට ලබාදුන් පිළිතුරෙහි අන්තර් ගත කර ඇත.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා

Vතක්සේරු මිළ ගණන් මොනවාද?

VI.ඉදිරිපත් කළ භාණ්ඩ මොනවාද?

VIIමෙම වෙන්දේසියෙන් ලද ආදායම කියද?

## ගරු සභාපතිතුමා

I. V. VI.VIIසඳහා පිළිතුරු පහත පරිදි වේ.

| අන අංකය | වෙන්දේසියට ඉදිරිපත් භාණ්ඩය | ප්‍රමාණයට | තක්සේරු මුදල (රු.) | වෙන්දේසිවු මුදල (රු.) |
| --- | --- | --- | --- | --- |

| | | | | |
|---|---|---|---|---|
| 01 | SG GH 7158 ටේලර් රථය (යකඩ සඳහා) | 01 | 5000.00 | 22000.00 |
| 02 | SG AT 8785 ත්‍රිරෝද රථය | 01 | 90000.00 | 180000.00 |
| 03 | SG GH 3599 යතුරු පැදිය | 01 | 5000.00 | 100000.00 |
| 04 | ලෙලෙන තලන යන්ත්‍රය | 01 | 20000.00 | වෙන්දේසි නොවිය |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා**

VIIඉදිරියේ දි මේ ආකාර භාණ්ඩ වෙන්දේසි පැවැත්විමට සැලසුම් කර තිබේද?

**ගරු සභාපතිතුමා**

. මේ වන විට නැත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ආර්.ලාල් නිශාන්ත මහතා**

V111.ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලයේ නාම ලේඛණය හා එක් එක් අයගේ කාර්යය භාරය සභාවට ඉදිරිපත් කරන්න.

ගරු සභාපතිතුමා

**<u>රාජකාරි පැවරීම - කාර්යාලීය කාර්ය මණ්ඩලය</u>**

**1.එච්.ඒ.ජී.එන් හෙට්ටිආරච්චි මිය (කළමනාකරණ සහකාර)**

1.සාමාන්‍ය හා පාලන ශාඛවේ අධීක්ෂණ කටයුතු
2.කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව
3.විශ්‍රාම වැටුප් සම්බන්ධ කටයුතු
4.චෙක්පත් වල දෙවැනි අත්සන යෙදීම
5.සභාවට අදාල නඩු ලිපිගොනු පවත්වාගෙන යෑම
6.රාජකාරි පැවරීම
7.බලතල පැවරීම
8.මු.රෙ.71 තනතුරු ඇති කිරීම
9.රැකියා විස්තර

**2. බී.එස්.එස්.කුමාරි මිය (කළමනාකරණ සහකාර)**

1.ආදායම් හා ගිනුම් ශාඛාවේ අධීක්ෂන කටයුතු
2.කාර්යාලයීය අභ්‍යන්තර විගණන කටයුතු
3.වැයපත් හා පිටතට යැවෙන වාර්තා පරීක්ෂා කිරීම
4.මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම හා වාර්ෂික සැලැස්ම පිළියෙල කිරීම
5.කාර්ය සාධන මෙවලම හා ඵලදායිතාව සම්බන්ධ රාජකාරි
6.දිනපතා තැපෑල
7.සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථ
8.ක්ෂේත්‍රයේ අයකරන බදු මුදල් වල නිවරදිතාවය පරීක්ෂා කිරීම

**3. කේ.ඒ.අමාලි නිසංසලා ගුණතිලක මිය (කළමනාකරණ සහකාර)**

1.ගිනි අනතුරු වැලැත්වීමේ සේවා
2.සභාව සතු නිල නිවාස සම්බන්ධ රාජකාරි
3.ජාතික විශේශ ව්‍යාපෘති වලට අදාල රාජකාරි

**4.එම්.කේ.අයි.ආර්.පි.ලක්මාලි මිය (කළමනාකරණ සහකාර)**

1.සභා කර්මාන්ත, පළාත් සභා කර්මාන්ත හා මධ්‍යම රජයේ කර්මාන්ත (විශේස ව්‍යාපෘති නොවන) වලට අදාල ලිපිගොනු සම්බන්ධ රාජකාරි

**5.එල්.ඩබ්.මිෂිලා ප්‍රියදර්ශනී මිය (කළමනාකරණ සහකාර)**

1.මුදල්පොත පවත්වාගෙන යෑම
2.චෙක්පත් ලිවිම හා ගෙවීම් කරන ලද වැයපත් බාරව කටයුතු කිරීම
3.වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ
4.හානි හා පාඩු ලේඛන පවත්වාගෙන යෑම
5.දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම
6.දුම්රිය,දුරකථන, ජල, විදුළි ,බිල්පත් පියවීම
7.මැතිවරණ රාජකාරි

**6. බී.එම්.එෆ්.සමීරා මිය (කළමනාකරණ සහකාර)**

1.දෛනික/මාසික/වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම
2.බැංකු සැසදුම පිළියෙළ කිරීම හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම
3.මාසිකව අයකර ගැනීමට අපේක්ෂිත ආදායම් හා වියදම් පිළිබද පුරෝකථන පිළියෙළ කිරීම හා වාර්තා සැකසීම
4.ආදායම් ප්‍රගති වාර්ත සැතසීම
5.වාර්ෂික අයවැය සැකසීම

6.ආදායම් හා වියදම් වල නිවරදිතාවය තහවුරු කර ගැනීම

## 7.එන්.එම්.එන්.රිෆාස් මයා (කළමනාකරණ සහකාර)

1.සභාවේගබඩා කටයුතු හා ඊට අදාල ලිපිලේඛන පවත්වාගෙනයෑම
2.සභාවට අයත් වාහන සම්බන්ධ කටයුතු
3.වාහන සඳහා බලපත්‍ර හා රක්ෂණාවරන ලබා ගැනීම
4.ආපදා විෂයට අදාල රාජකාරි

## 8. බී සදිස් කුමාර් මයා (කළමනාකරණ සහකාර)

1.සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
2.සියළුම භාණ්ඩ හා සේවා සැපයීමේ රාජකාරි
3.ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රාජකාරි
4.කාබනික පොහොර අලෙවිය, අලෙවි ප්‍රවර්ධනය හා ගිනුම්ගත කිරිම

## 9. සකුන්තලා විරසිංහ මිය(කළමනාකරණ සහකාර)

1.සියළුම කාර්ය මණ්ඩලයේ වැටුප් සැකසීමට අදාල රාජකාරි
2.සේවක ණය ගෙවිමට කටයුතු කිරීම හා සේවක ණය ලේඛනය යාවත්කාලිනව පවත්වාගෙන යෑම
3.අතිකාල,නිවාඩු දින වැටුප් , ගමන් වියදම් සම්බන්ධ රාජකාරි
4.මන්ත්‍රී දිමනා ගෙවිමට අදාල රාජකාරි
5.සේවක ඇප සම්බන්ධ රාජකාරි
6.අග්‍රහාර ප්‍රතිලාභ සම්බන්ධ රාජකාරි
7.දායක විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම

## 10. මුජීබා රවුෆ් මිය(කළමනාකරණ සහකාර)

1.සභාවට ලැබෙන මුදල්. චෙක්පත්, මුදල් ඇණවුම් බාර ගැනිම හා බැංකුගත කිරිම
2.මුදල් අය කර නිකුත් කරනු ලබන සියළුම ආකාති පත්‍ර නිකුත් කිරීම
3.සුළු මුදල් අග්‍රිමය පවත්වාගෙන යෑම
4.දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රතිපූරනය කළයුතු බදු මුදල් ප්‍රතිපූරනය කිරීම
5.ආදාහනාගාරය වෙන් කිරීමට ැදාල රාජකාරි
6.ප්‍රා.ස.02 ,ප්‍රා.ස 05 ආදායම් වාර්තා පිළියෙළ කිරීම

**11. ටි.එන් වික්‍රමආරච්චි මිය (කළමනාකරණ සහකාර)**

1.ස්ථාවර වත්කම් සම්බන්ධ රාජකාරි
2.පුහුණු විෂයට අදාල රාජකාරි
3.පුහුණු අභ්‍යාසලාභින් සම්බන්ධ කටයුතු
4.කාර්යාල අධීක්ෂණ වාර්තා පිළියෙළ කිරීම
5.කාර්යාලයය යතුරු පුවරුව සම්බන්ධ රාජකාරි
6.රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
7.නිවාඩු විෂයට අයත් රාජකාරි
8.පෙර පාසල් පුස්තකාල අධීක්ෂණය හා විෂවය අදාල ලිපිගොනු නඩත්තු කිරීම
9.අතුරු ව්‍යවස්ථා පිළියෙළ කිරීම

**12. ඩබ්.ඩබ්.ඩී.නදීෂා මිය(කළමනාකරණ සහකාර)**

1.ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම
2.වීථි රේඛ සහතික නිකුත් කිරීම
3.අනවසර ඉදිකිරීම් සම්බන්ධ රාජකාරි
4.විද්‍ුයුත් තැපැල පරීක්ෂා කිරීම

**13. එම්.දර්ශනී මාරසිංහ මිය (සංවර්ධන නිලධාරි)**

1.වැය ලේඛන . අත්තිකාරම් ලේඛන, තැන්පත් ලේඛන .ණයහිමි ලේඛන 2.පවත්වාගෙන යැම
3.විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම
4.වැයපත් සහතික කිරීම

**14.ඩබ්.ආර්.අයි.අයි.රොඩ්රිගු මිය (සංවර්ධන නිලධාරි)**

1.බල ප්‍රදේශයේ පාරසරික තොරතරු එක්රැස් කර කරගැනිම හා විශ්ලේශනය කිරිම
2.පරිසර විෂයට අදාල සියළුම රාජකාරි
3.සෞඛ්‍ය විෂයට අදාල සියළුම රාජකාරි
4.උත්සව කටයුතු සංවිධානය කිරීම
5.සංඛ්‍යාලේඛන විෂයට අදාල රාජකාරි

**15. ඩබ්.ඒ.නිලූකා සුදර්ශනී මෙනවිය(සංවර්ධන නිලධාරි**)

1.සභාව සතු වත්කම් වාර්ෂිකව බදුදීම හා ඊට අදාල රාජකාරි
2.අක්කර බදු විෂයට අදාල සියළුම රාජකාරි

**16.ආර්.එච්.නිශාන්ති මිය (සංවර්ධන නිලධාරි)**

1.මහ සභා රැස්වීම පැවැත්වීම, වාර්තා සකස් කිරිම ඇතුළු සභා කටයුතු සම්බන්ද සියළුම රාජකාරි
2. කමිටු රැස්වීම් වලට අදාල සියළුම රාජකාරි
3.ලේඛනාගාර භාරකරු ලෙස රාජකාරි ඉටු කිරීම

**17.ටී.චමිලා සජීවනී මිය (සංවර්ධන නිලධාරි)**

1.ජනපතිට කියන්න පරිඝණක වැඩයටහනේ සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කිරිම
2.අනතුරුදායක ඩගස් සම්බන්ධ රාජකාරි
3.වීථි පහන් සම්බන්ධ රාජකාරි
4.ව්‍යාපෘති සම්බන්ධ ශඛ්‍යතා අධ්‍යයනය
5.මාර්ග පවරා ගැනීම හා අත්පත් කර ගැනිම
6.මාර්ග හා කාණු ඉන්වෙන්ට්‍රි ලවත්වාගෙන යෑම
7.වටරවුම් හා ඔරලෝසු කණු නඩත්තුව

**18.ආර්.එම්.අයි.රාමනායක මිය (සංවර්ධන නිලධාරි)**

1.වරිපනම් බදු විෂයට අයත් සියළුම රාජකාරි

**19.එම්.ඩී.පි.ගුනරත්න මිය (සංවර්ධන නිලධාරි)**

1.වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු සම්බන්ධ රාජකාරි
2.වෙනත් ආදායම් විෂයට අදාල රාජකාරි
3.උසාවි දඩ හා මුද්දර ගාස්තු
4.ගෙවල් කුලී පනතට අදාල රාජකාරි
5.ක්‍රීඩාපිටිය වෙන් කිරි
6.අයාලේ යන ගවයන් ඇල්ලිම

**.එම්.වී.කේ.අබේවික්‍රම මිය (සංවර්ධන නිලධාරි)**

1.සභාව සතු වත්කම් සමබන්ධ ගැටළු පිළිබඳව රාජකාරි

**සටහන -**

I. සංවර්ධන නිලධාරී තනතුරු 04 ක් පුරප්පාඩුව පවතින අතර නිළධාරිනියන් තිදෙනෙකු ප්‍රසෘත නිවාඩු ලබා සිටිති. මෙකී තනතුරු වල රාජකාරි කාර්ය මණ්ඩලය අතර බෙදා ඉටු කරවා ගනු ලබයි.

2.සිපෝත් ප්‍රදේශය තුළ වෑ ඔය යොදා ගනිමින් ඉදි වූ බලාගාරය සඳහා පහසුකම් සැපයීමට කටු කිතුල මාර්ගය යොදා ගන්නා ලදි.එමගින් එම මාර්ගයට සිදු වූ හානිය සම්බන්ධයෙන් යම් මුදලක් ප්‍රාදේශිය සභාවට එම ආයතනයෙන් තැන්පත් කළ අතර එමගින් එම මුදල නිදහස් කොට එය සංවර්ධනය කළත් එය නිසි ලෙස සංවර්ධනය නොවූ බවත් එම මාර්ගයේ එම මුදල සඳහා වැඩ විස්තරයක් ඉදිරිපත් කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඩබ්.එච්.ඒ.බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කර ඇත.

## (ඉ) යථා පරිදි කල් දි ඇති යෝජනා

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ටි.පි.ජි.විමල් කේ.අල්විස් මහතා ඔබගේ යෝජනාව මෙම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙස මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිටි.පි.ජි.විමල් කේ.අල්විස් මහතා**

(ඉ).1.ගරු සභාපතිතුමනි,.කිතුල්ගල උතුර වසමේ ඉඹුල පුස්ස මාර්ගය හා කිතුල්ගල දකුණ වසමේ බටතැන්නට යන මාර්ගයත් දික්හේන මාර්ගයත් සංවර්ධනය කිරිම සඳහා සභාවේ බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙස මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.එයට වැඩිමනක් වශයෙන් මෙය හැමෝටම ඇති ගැටළුවක්.එම නිසා සභාවේ සියළුම මන්ත්‍රිතුමන්ලාට තම කොට්ඨාශයේ සභාව සතු මාර්ග සකස් කිරිම සඳහා පැයකට හෝ පැය දෙක තුනකටවත් ලබා දෙන ලෙස මා ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**

සියළුම මන්ත්‍රිතුමන්ලා හට සභාවේ බැකෝ යන්ත්‍රය නොමිලේ ලබා දිම සඳහා ඉදිරියේදි ක්‍රම වේදයක් සකස් කිරිමටත් දැනට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ටි.පි.ජි.විමල් කේ.අල්විස් මහතාගේ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් හෝ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 01)**

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා ඔබගේ යෝජනාව මෙම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙස මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා**

(**ඉ**)2.ගරු සභාපතිතුමනි**,**යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් මත්තමගොඩ තලෝවිට ඉහළ ගම්මැද්ද පාරේ කාණු පද්ධතිය සකස් කිරිම සඳහා බැකෝ යන්ත්‍රය ලබා ගැනිම සඳහා මා යෝජනා කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 02**)

## ගරු සභාපතිතුමා

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා ඔබගේ යෝජනාව මෙම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙස මා දන්වා සිටිනවා.

## ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා

(ඉ)3.යටියන්තොට ප්‍රාදේශිය සභා බල ප්‍රාදේශයට අයත් මත්තමගොඩ ගම්වාසින්ට බලපා තිබෙන කුණු ගැටළුව සඳහා සතියකට දෙවතාවක්වත් කුණු ගන්නා ටැක්ටරය ලබා දෙන ලෙස මා යෝජනා කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා ඔබගේ යෝජනාව හොඳයි නමුත් දැනට සභාවට ඇත්තේ කුණු ට්‍රැක්ටර් දෙකක් පමණයි.අපිට දැන්මනම් එම යෝජනාව කර ගැනිමට හැකියාවක් නැනමුත් ඉදිරියේ දි අනිවාර්යෙන්ම එය ඉටු කර දිමට මා බලාපොරොත්තු වෙනවා. කුණු ටැක්ටරයක් ඉදිරියේ දි ලබා දිම සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඩතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 03**)

## ගරු සභාපතිතුමා

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා ඔබගේ යෝජනාව මෙම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙස මා දන්වා සිටිනවා.

## ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මහතා

(**ඉ**)4.මත්තමගොඩ ගම්වාසින් ප්‍රධාන මාර්ගයෙහි වැහි ආවරණ ලබා ගැනිම සඳහා වන ඉල්ලිම අනුව කටයුතු සිදු කර දෙන මෙන් මා යෝජනා කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.එයට වැඩිමනක් වශයෙන් යටියන්තොට ජාතික පාසල ඉදිරිපිටටත් මගි ආවරණයක් ලබා දෙන ලෙස මා ප්‍රකාශ කරනවා.

## ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමන්ලා සියළුම දෙනා අවශ්‍ය මගි ආවරණ සඳහා ස්ථාන ලබා දෙන ලෙස ප්‍රකාශ කරනවා.ඒ අනුව එම මගි ආවරණ ඉල්ලිම සඳහා මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය වෙත ලිපි නිකුත් කිරිමට කටයුතු සිදු කිරිම සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 04)**

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මහතා ඔබගේ යෝජනාව මෙම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙස මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මහතාගේ යෝජනාව**

(ඉ)5.ගල්පාත වසම තුළ පිහිටි ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ගවල ඇති වීථි පහන් අළුත්වැඩියා කර ගැනීම සහ අළුතින් විථි ලාම්පු සවි කිරීම සඳහා මා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්, විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 05)**

**ගරු සභාපතිතුමා**

(ඉ) 6.ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ස්ථිර ජල සැපයුමක් ලබා ගැනිම සඳහා අවශ්‍ය ජල මෝටරයක් මිලදී ගැනිමසදහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එන්.කේ.නිමල් කුමාරසිරිමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 06**)

**ගරු සභාපතිතුමා**

(ඉ)7.යටියන්තොට ප්‍රාදේශිය සභාවේ සෞඛ්‍ය කම්කරු සේවයේ නියුතු ආර්.ජානක විරතුංග මහතා හට දසමස් ආපදා ණය මුදලක් ලබාගැනිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.කේ.නිමල් විජේසූරියමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 07)**

**ගරු සභාපතිතුමා**

(ඉ)8.කලටුවාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇතිදැනට පවතින දැඩි සුළං තත්වය හේතුවෙන් ගස් කිපයක් බිමට කඩා වැටි ඇත.පවතින වැසි සහිත කාලගුණය හේතුවෙන් එම ගස් දිරාපත් විමේ ඉඩ කඩ ඇති බැවින් ඒවා වෙන්දේසි කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

*ඒ සඳහා පහත නම් සදහන් කමිටුවක් පත් කිරිම සුදුසු බවට මා යෝජනා කරනවා.

1.ගරු උපසභාපතිතුම ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා
2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එන්.කේ.නිමල් කුමාරසිරි මහතා
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මහතා
5.ගරු ලේකම්තුමිය
6.විෂය භාර නිළධාරි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.කේ.නිමල් විජේසූරියමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් , විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 08)**

**ගරු සභාපතිතුමා**

(ඉ)9.පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් පවත්වනු ලබන පරිඝණක පාඨමාලාව සඳහා මෙම ආයතනයේ කාර්මික නිලධාරි ඩබ්.ඒ.ජී.ඩි.කරුණාජීව මහතා සහභාගි කිරිමට අපේක්ෂා කරන අතර එම පාඨමාලා ගාස්තුව වන

ර.25000.00ක මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි..(පුහුණු සඳහා වෙන් කර ඇති මුදලින්)

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 09)**

## ගරු සභාපතිතුමා

(ඉ)10.2018 වර්ෂයේ 07 වන මාසයේ සිට අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 10)**

**ගරු සභාපතිතුමා**

(ඉ).11.යටියන්තොට පුස්තකාලය සඳහා පහත සඳහන් දමිල පොත් 09 ක් ලබා මිලදී ගැනිමට හා ඒ සඳහා ර.4310.00ක මුදලක් ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

1.කඩන්දු පේගුදල් - රු.500.00
2.තුයරම් සුමප්පවර්ගල් -රු.630.00
3.කඩලිකරම් - රු.400.00
4.අගදි - රු.350.00
5.යාර් ඉන්ද -පුලවර් - රු.200.00
6.ඔන්රුක්කුල් ඔන්රු - රු.700.00
7.පදිනින්ගාට් නාල් සන්දිරියන්-රු.630.00

8.පදින්නාන්ගාම් නාල් සන්දිරන්-රු.500.00
9.ඒ අවනාල් මුඩියුම් රු.400.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

(**සභා තීරණ අංක 11)**

**ගරු සභාපතිතුමා**

(ඉ)12.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් රක්ෂණාවරණ වාර්ෂිකව දිර්ඝ කිරිම සඳහා ශ්‍රි ලංකා රක්ෂණ සංස්ථාව මගින් බිල්පත් ඉදිරිපත් කර ඇත

1.wpll 7733 කෘකැබ් රථය - 2018.07.14 -2019.07.13 -රු.45461.55
2.wpll 6433 ටිපර් රථය - 2018.07.14 -2019.07.13 -රු.111072.23
එම මුදල ගෙවිමි කිරිම සඳහා සදහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා
කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එන්.කේ.නිමල් කුමාරසිරිමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 12**)

**ගරු සභාපතිතුමා**

(ඉ)13.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් අංක ZA5057 දරණ බැකෝ යන්ත්‍රය සේවා කිරිම වෙනුවෙන් රු.19410.00ක් වටිනා බිල්පතක් යටියන්තොට සුරංග සේවිස් සෙන්ටර් වෙතින් ඉදිරිපත් කර ඇත.එම මුදල ගෙවිම් කිරිම සඳහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.කේ.නිමල් විජේසූරියමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

(**සභා තීරණ අංක 13)**

**ගරු සභාපති තුමා**

(ඉ)14.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018.04.30 දින සිට 2018.05.31 දක්වා ඉන්ධන ලබා ගැනිම වෙනුවෙන් රු.162947.00ක් වටිනා බිල්පතක් යටියන්තොට විවිධසේවා සමූපකාර සමිතිය මගින් ඉදිරිපත් කර ඇත.එම මුදල ගෙවිම් කිරිමසඳහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.කේ.නිමල් විජේසූරියමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 14)**

**ගරු සභාපතිතුමා**

(ඉ)15.බදු කුලි විෂය සම්බන්ධයෙන් පවතින ලිපිගොනු ආරක්ෂිතව තබා ගැනිමට අවශ්‍ය බැවින් ඒ සඳහා කුඩා ප්‍රමාණයේ කබඩ් එකක් මිලදී ගැනිමගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 15)**

**ගරු සභාපතිතුමා**

(ඉ)16.යටියන්තොට වෙළඳ පල අංක 20A කඩ කාමරය රු.960000.00 ක අවම ලන්සුව යටතේ ටෙන්ඩර් කළ අතර 2018.03.06 දින ටෙන්ඩර් විවෘත කරන ලදි.එහිදි වැඩිම ලන්සු මුදල වශයෙන් රු.1200000.00 කට ආර්.අම්බිගෙයිපාන් මහතා ටෙන්ඩර් ලබා

ගත් අතර ඔහු විසින් ගබඩාවක් පවත්වාගන යාමට ඉල්ලීම් කරන ලදි.ටෙන්ඩර් දැන්වීමේ සඳහන් වෙළදාම් පමණක් පවත්වාගන යා යුතු බැවින් එහි ගබඩාවක් සඳහන් කර නොමැත.

ටෙන්ඩර් විවෘත කර දැනට මාස 03ක් ගත වී තිබුනත් කඩකාමරය මෙතෙක් කිසිදු ටෙන්ඩර් කරුවෙකුට ලබා දී නොමැත.එබැවින් (දෙවැනි ලන්සුව රු.1150000.00 - තෙවැනි ලන්සුව රු.1050000.00)ටෙන්ඩර් කරුවන් සඳහා කඩ කාමරය ලබා දෙන්නේද යන්න පිළිබඳවගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසුද බව යෝජනා කරමි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මහතා

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.නමුත් ගරු සභාපතිතුමනි,මෙම කඩ කාමරය සම්බන්ධයෙන්අම්බිගෙයිපාන් මහතා වෙළද ව්‍යාපාරයක් සඳහා නොවන , බවත් ගබඩාවක් පවත්වාගන යාමට අවසර ඉල්ලන බව ලිඛිතව ඉල්ලීමක් අරගත යුතුයි.ඒම හේතුවෙන් මෙම කඩ කාමරය ප්‍රාදේශිය වශයෙන් නැවත ටෙන්ඩර් කර ලබා ගැනිම සුදුසු යැයි මා ප්‍රකාශ කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා

ගරු සභාපතිතුමනි,සභාවෙන් මෙම කඩ කාමර දෙක ඉදි කළා.එක් කඩ කාමරයක් දීලා ගියෙනවා.අනෙත් කඩ කාමරය මොන පදනමේ යටතේ,මොන ක්‍රම වේදයකට දීලාද කියලා විස්තරයක් අපට අවශ්‍යයි.

## ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතමා ඔබගේ ප්‍රශ්ණය කල් දී ඇති ප්‍රශ්ණ යටතේ ඉදිරිපත් කරන්න.සභාව පැවැත්වීමට වැඩ කරන දින 07 කට කලින් ඉදිරිපත් කරන ලෙස දන්වමි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මහතා

ගරු සභාපතිතුමා ,මේ කඩ කාමරය තෙවරක් ටෙන්ඩර් කර ඇති බැවින්,1වන ටෙන්ඩර් කරුට වෙළද ව්‍යාපාරයක් සදහා මෙම කඩ කාමරය නොගන්නවානම් ,දෙවන ටෙන්ඩර්කරුට ලබා දිය යුතුයි.එසේත් නොමැතිනම් නැවත ටෙන්ඩර් කළ යුතුයි.

## ගරු සභාපතිතුමා

20A කඩ කාමරය සඳහා වූ ටෙන්ඩරය අවලංගු කර ප්‍රාදේශිය වශයෙන් නැවත ටෙන්ඩර් කිරිම සඳහා වූ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 16)**

**ගරු සභාපතිතුමා**

(ඉ)17.යටියන්තොට පොදු වෙළදපලෙහි කඩ කාමර සම්බන්ධයෙන් ස්ථාන පරික්ෂාවක් 2018.06.06 දින සිදු කල අතර එහිදී හදුනාගත් නිරික්ෂණ සඳහා ගතයුතු ක්‍රියාමාර්ගද කමිටුව විසින් හදුනා ගන්නා ලදි.ඒ අනුව එහි ඉදිරි කටයුතු සඳහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි. ස්ථානිය පරික්ෂාවේ අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 17)**

## ගරු සභාපතිතුමා

(ඉ)18.නව සතිපොළ ගොඩනැගිල්ල ඉහළ මහල වෙළද ව්‍යාපාරයකට රු.10020000.00 අවම ලන්සුව යටතේ ටෙන්ඩර් කර ඇති අතර ටෙන්ඩර් විවෘත කිරීම 2018.07.06 දින පෙ.ව.10.30 ට සිදු කිරීමට නියමිතව ඇත.එදින ටෙන්ඩර් ඉදිරිපත් නොවුනහොත් පහත ඉල්ලීමට අනුව මෙම ගොඩනැගිල්ල බදු පදනම මත ලබා ගැනිමට ඉල්ලීමක් ඉදිරිපත් වි ඇති අතර ඉහළ මාලය රුපියල් මිලියන 06ක් ද පහළ මාලය රුපියල් මිලියන 05ක් ද මූලික තැන්පතුවක් වශයෙන් ලබා දිමට හැකි බවත් දන්වා ඇත.තක්සේරුවට අනුව මාසික කුලිය ඉහළ මාලය සඳහා රු.83500.00 ද පහළ මාලය සඳහා රු.90000.00 ද දක්වා ඇතත් ඉල්ලීමට අනුව ඉහළ මාලය සඳහා රු.80000.00ද පහළ මාලය සදහා රු.60000.ද දක්වා ඇත.මෙම ඉල්ලිම සඳහා සුදුසු තීරණයකට එළඹිම සදහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමාගේ යෝජනාව

## ගරු උපසභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා

ඒ යොජනාව මා විසින් ස්ථිර කරනවා.මෙම ගොඩනැගිල්ල ටෙන්ඩර් නොවුන බැවින් ගොඩනැගිල්ල වසා තැබිම නිසා අපේ සභාවට ආදායම අහිමි වෙනවා වගේම ගොඩනැලිල්ල අභාවයට යනවා.එම නිසා අපේ සභාවට කිසියම් අදායමක් ලබා ගැනිමේ පරමාර්ථයෙන් මෙම මහතාට මෙම ගොඩනැගිල්ල ලබා දිම සුදුසුයි කියා මා ප්‍රකාශ කරනවා.

2018.07.06 වන දින ටෙන්ඩර් විවෘත කිරිමේ දි එකදු ටෙන්ඩරයක්වත් ලැබි නොමැති බැවින් ටෙන්ඩර් මණ්ඩලය තීරණය වූයේ ඉහළ මාලය සදහා කී මනි වශයෙන් රුපියල් ලක්ෂ 60 කටත් මාසික කුළිය රු.83500.00 ටත්පහළ මාලය සදහා කි මනි මුදල රුපියල් ලක්ෂ 50 කටත් මාසික කුළිය රු.65000.00කටත් ඉලිලම්කර ඇති අංක 01 ,කබුළුමුල්ල,යටියන්තොට පදිංචි ආනන්ද විතානගේ මහතාට ලබා දිම සදහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනිම සදහා යොමු කිරිමට මා ප්‍රකාශ කරනවා.

## ගරු සභාපතිතුමා

2018.07.06 වන දින පැවති ටෙන්ඩර් මණ්ඩලය තීරණය අනුව ඉහළ මාලය සදහා කී මනි වශයෙන් රුපියල් ලක්ෂ 60 කටත් මාසික කුළිය රු.83500.00 ටත්පහළ මාලය සදහා කි මනි මුදල රුපියල් ලක්ෂ 50 කටත් මාසික කුළිය රු.65000.00කටත් ඉලිලම්කර ඇති ආනන්ද මහතාට ලබා දිම සදහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනිම සදහා යොමු කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්, විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 18)**

## ගරු සභාපතිතුමා

(ඉ)19පළාත් පාලන ආයතන වල ප්‍රධානින් සඳහා ඔවුන්ගේ ධුර කාලයට පමණක් සීමා වන සේ කොන්ත්‍රාත් පදනම මත මාසිකව රු.12000.00 දීමනාවක් මත පෞද්ගලික ලේකම්වරයෙකු පත් කර ගැනිමට අංක 04/2014. හා 2014.11.08 දිනැති චක්‍රලේඛ මගින් සංශෝධිත ඔබගේ අංක **CLG/21/30** හා 2009.11.23 දිනැති උපදෙස් ලිපිය මගින් අනුමැතිය ලබා දි ඇත.

ඒ අනුව පෞද්ගලික ලේකම් තනතුර සඳහා අංක 266 ,ගිණිගත්හේන පාර,යටියන්තොට ලිපිනයේ පදිංචි කේ.වි.විදුරංග සුරේන්ද්‍ර මෙන්ඩිස් මහතා පත් කිරිම සඳහා වූගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 19)**

## ගරු සභාපතිතුමා

(**ඉ**)20.2018 -2021 දක්වා සිවු අවුරුදු මධ්‍යකාලින සැලැස්මේ කෙටුම්පත ගරු මහසභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය

එම යෝජනාව මා ස්ථිර කරනවා.

## ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 20)**

**ගරු සභාපතිතුමා**

(ඉ)21දීර්ඝ කාලයක සිට විවිධ ණය හිමි ලේඛණය හා තැන්පත් ලේඛණය තුළ රදාවාගෙන ඇති කර්මාන්තවලට අදාළ රැදවුම් මුදල හා වෙනත් තැන්පත් මුදල ලිපි ගොනු පරික්ෂා කිරිමෙන් අනතුරුව විධිමත් ලෙස කොන්ත්‍රාත් කරුවන් වෙත ගෙවිම් කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු ද යන්න යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.කේ.නිමල් විජේසූරියමහතා**

ගරු සභාපතිතුමනි මෙම මුදල් ගෙවිමේ දි කොන්ත්‍රාත්කරුවන් හදුනාගන ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරගත යුතුයි.මේ අයගේ විස්තර මෙහි සදහන් වෙලා නැ.ඉදිරි සභා වාරයේදි විස්තර වාර්තාවක් සමග ඉදිරිපත් කරන්න කියා ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉදිරි සභා වාරයේදි විස්තර වාර්තාවක් සමඟ ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 21)**

**ගරු සභාපතිතුමා**

(ඉ)22.යටියන්තොට සතිපොළ වටා ආරක්ෂක වැට හා ගේට්ටුව ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත ව්‍යාපෘතියෙහි මේ වන විට නිම කරන ලද වැඩ කොටස් සදහා මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව කොටස් මුදල් ගෙවීම් කිරිම සදහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තු මුදල - රු.1925526.00

ගෙවිමට ඇති කොටස් මුදල (දළ) - රු.500000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරිමහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදී.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 22**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.යටියන්තොට බස් නැවතුම්පළ අසල ගොඩනැගිල්ලෙහි සභාව සතු කඩ කාමර 10 ට අයත් එහි ඉහළ මාලය කඩ කාමර 10 ක් ඉදි කිරීම සදහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.(කි මනි මුදලින්)

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරිමහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

### ගරු සභාපතිතුමා

මෙම කඩ කාමර 10 නව සතිපොළ ගොඩනැගිල්ල බදු දීමෙන් ලැබෙන කි මනි මුදලින් ඉදි කිරිමට සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 23**)

### ගරු සභාපතිතුමා

(ඉ)24.යටියන්තොට බල ප්‍රදේශය තුළ සිටින දෘශ්‍යාබාධිත පුරවැසියන් වෙනුවෙන් යටියන්තොට මහජන පුස්තකාලයේ දෘශ්‍යාබාධිත ඒකකයක් සකස් කිරිම සදහා අවශ්‍ය කථන ගැන්විම හා බ්‍රේල් ක්‍රමයට සැකසුණු ග්‍රන්ථ ලබා ගැනිම සදහා රු.30000.00ක උපරිමයකට යටත්වගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු යෝජනා කරමි.

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය

එම යෝජනාව මා ස්ථිර කරනවා.

### ගරු සභාපතිතුමා

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්, විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 24)**

**ගරු සභාපතිතුමා**

(ඉ)25.ක්‍රිඩාංගනය අසල ඇති ප්‍රාදේශිය සභාව සතු ගොඩනැල්ල ආයුර්ේද මධ්‍යස්ථානයක් පවත්වාගන යාමටත් අදාල වෛද්‍යවරු හා බෙහෙත් ආදිය සබරගමු පළාත් සභාවෙන් ලබා ගැනිමටත් සබරගමු පළාත් ආණ්ඩුකාර තුමියගේ අනුමැතිය ලබා ගැනිම සදහාගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඩතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 25)**

**ගරු සභාපතිතුමා**

(ඉ)26.මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය නිමිතිකරගන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහනක් පැවැත්විමටත් අදාල රු.27000.00ක වියදම් සභා අරමුදලින් ගෙවීම් කිරිමටත් සදහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනාකරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා**

ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.එයට වැඩිමනක් වශයෙන් මා ප්‍රකාශ කරන්න කැමතියි.දැනට කිතුල්ගල ප්‍රදේශයේ බෝහෝ ජනතාව මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවෙලා ඉන්නේ.පාසල් අවට මේ පරිසරය දැන් හැදිලා ඉවරයි.දැන් පාසල් හරහා ව්‍යාප්ත වෙමින් පවතිනවා.අපි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා ඉන්න මිනිසුන් ඒකෙන් මුදවාගන සාමාන්‍ය පුද්ගලයෙකු හැටියට සමාජයේ ජිවත් වෙන්න හැකි ක්‍රමයකට පත් කරන්න කුමන හෝ වැඩ පිළිවෙලක් යොදා ගනිමු.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මහතා

ගරු සභාපතිතුමනි,යටියන්තොට ප්‍රදේශයෙත් මේ වන විට මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් තියෙනවා.
අපි සභාවක් හැටියට මේකට මැදිහත් වෙලා මොකක් හරි වැඩපිළිවෙලක් යොදමු.

## ගරු උපසභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා

ගරු සභාපතිතුමනි,විශේෂයෙන් කිතුල්ගල,යටියන්තොට ප්‍රදේශයේ ජනතාව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තියෙන්නේ මෙවැනි දේවල් නිසා හොරකම් රාශියක් මේ ප්‍රදේශයේ සිද්ධ වෙනවා.යම් ප්‍රචාරාත්මක වැඩසටහනක් තරුණ තරුණියන් අතරට ගෙනයන්න ඕන.මේ ප්‍රදේශයේ විද්‍යාල වල උසස්පෙළ සාමාන්‍ය පෙළ දරුවන් එකතු කරලා හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරමු.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මහතා

ගරු සභාපතිතුමා ,පනාවත්ත නො.1 මේ ප්‍රශ්ණය තියෙනවා.මොනවාහරි සැලසුමක් කරනවානම් වතුකරයේ ජනතාවත් සම්බන්ධ කර ගනිමු.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.පි.ජී.ඩබ්ලිව්.කිර්තිසේන අල්විස් මහතා

ගරු සභාපතිතුමනි,මේ දේට ඇබ්බැහිවෙලා ඉන්න අයට වඩා අළුතින් එකතුවිමට සැරසෙන පාසල් දරුවන් දැනුවත් කරමු.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය

ගරු සභාපතිතුමනි ,මේ සඳහා පාසල් විදුහල්පතිතුමන්ලා දැනුවත් කරලා උසස්පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් පවත්වමු.

**ගරු සභාපතිතුමා**

විශේෂයෙන්ම අපි අපේ අනාගතය භාරගන්න ඉන්න දරුවන් මේ ගොදුරට හසු නොවන අයුරින් අපි බේරා ගත යුතුයි.එම නිසා මේ මස 2018.07.24 වන දින ගරු සභාවේ සියළුම මන්ත්‍රීතුමන්ලාත් සහභාගි කරගන පොලිසියත,සියළු පාසල්වල විදුහල්පතිතුමන්ලාත්,ප්‍රාදේශිය ලේකම් තුමත් සමග සාකච්ඡාවක් යොදාගන වැඩපිළිවෙලක් හදමු.මේ සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 26)**

**ගරු සභාපතිතුමා**

(ඉ)27.දිළිදුබව හේතුවෙන් වර්ෂ ගණනාවක සිට වරිපනම් බදු නොගෙවිම මත දේපළ ස්ථාන 28 ක් කපා හැරිමට ගරු පළාත් පාලන ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනිමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

<u>ස්ථාන නොමැතිව තක්සේරු වටිනාකම් ලබා දී ඇති ස්ථාන ලේඛණයෙන් ඉවත් කිරීම.</u>

(කේ.එම් ගුණතිලක මහතා-ආදායම් පරීක්ෂක)

01.කො.අ.08-ව.අ.45/6-පනාවත්ත පාර වම-අයිතිකරු-2018.06.30 දක්වා හිගය-4021.91

02.කො.අ.08-ව.අ.35/B-පනාවත්ත පාර වම-බී.එස් ද සිල්වා-2018.06.30 දක්වා හිගය-2641.73

03.කො.අ.02-ව.අ.112-පරුස්සැල්ල පාර දකුණ-හිල්ඩා කුමුදුණී.2018.06.30 දක්වා හිගය-541.92

04.කො.අ.01-ව.අ.233/C-පරුස්සැල්ල පාර වම-අයිතිකරු-2018.06.30 දක්වා හිගය-188.95

05.කො.අ.01-ව.අ.91/13F-පරුස්සැල්ල පාර වම-ආර්.ජී.ජිනදාස-2018.06.30 දක්වා හිගය-1883.79

06.කො.අ.09-ව.අ.23-ගිණිගත්හේන පාර වම-නිල්මිණි පලිස්කාර-(නවත් පරීක්ෂාකර බැලිය යුතුය)

07.කොඅ.09-ව.අ.100-ගිණිගත්හේන පාර දකුණ-2018.06.30 දක්වා හිගය-2404.56

08.කො.අ.08-ව.අ.10/6-දෙගල්ලස්ස පාර දකුණ-අයිතිකරු හි.කි.මුනිසාමි-2018.06.30 දක්වා හිගය-10944.00

09කො.අ.08-ව.අ.179-යටියන්තොට පාර දකුණ-ඒ.එම්.කරුණාවති -2018.06.30 දක්වා හිගය-2661.16

<u>ස්ථාන නොමැතිව තක්සේරු වටිනාකම් ලබා දී ඇති ස්ථාන ලේඛනයෙන් ඉවත් කිරිම.</u>

(උදය කුලපති මහතා-ආදායම් පරික්ෂක)

01.කො.අ.01-ව.අ.56/5A -කරවනැල්ල පාර දකුණ-අයිතිකරු-2018.06.30 දක්වා හිගය-10280.83

02.කො.අ.03-ව.අ.25- ගිණිගත්හේන පාර වම-ඒ.ජී. පෙරේරා සහ පුත්‍රෙයෝ-2018.06.30 දක්වා හිගය-13304.78

03.කො.අ.03-ව.අ.78-ගිණිගත්හේන පාර දකුණ-එම්.ඩබ්.පෙරේරා හි.කි.පතිරණ-2018.06.30 දක්වා හිගය-761.17

04.කො.අ.03-ව.අ.781/1-ගිණිගත්හේන පාර දකුණ-එම්.ඩබ් පෙරේරා හි.කි.පතිරණ-2018.06.30 දක්වා හිගය.-579.46

05.කො.අ.03-ව.අ.78 2/1-ගිණිගත්හේන පාර දකුණ-එම්.ඩබ් පෙරේරා හි.කි පතිරණ-2018.06.30 දක්වා හිගය-486.50

06කො.අ.03-ව.අ.78 3/1-ගිණිගත්හේන පාර දකුණ-එම්.ඩබ් පෙරේරා හි.කි පතිරණ-2018.06.30 දක්වා හිගය-486.50

07.කො.අ.06,07-ව.අ.248-කරවනැල්ල පාර-අයිතිකරු හි.කි පී.එස් කුමාර රත්න-2018.06.30 දක්වා හිගය-1376.82

08.කො.අ.05-ව.අ-22-අතුරු මාවත දකුණ-අයිතිකරු(ප්‍රා.සභාව)ක්‍රිඩාංගන ගොඩනැගිල්ල-2018.06.30 දක්වා හිගය-3811.10

09.කො.අ.05-ව.අ.-20/3- අතුරු මාවත දකුණ-කේ.ඇලිස් නෝනා-2018.06.30 දක්වා හිගය-636.22

10.කො.අ.05-ව.අ.71/16B-කරවනැල්ල පාර වම-පි.වර්දපුර්-2018.06.30 දක්වා හිගය 3346.38.

11.කො.අ.03-ව.අ.123/3-ගිණිගත්හේන පාර වම -ජී. හාමිනෝනා හි.කි ශ්‍රියාලතා-2018.06.30දක්වා හිගය-15481.32

12. කො.අ.01-ව.අ.116-කරවනැල්ල පාර දකුණ ටි.එස් මෙන්ඩිස් -2018.06.30දක්වා හිගය-3008.44

13. කො.අ.05-ව.අ.28/26-අතුරු මාවත දකුණ එම්.ජී.පෙරේරා සහ පුත්‍රයෝ -2018.06.30දක්වා හිගය-2997.74

## <u>දිළිදුකම හේතුවෙන් වරිපනම් නිදහස් කිරිම</u>

1.කො.අ.09-ව.අ.118-ගිණිගත්හේන පාර දකුණ-ඒ.නිකලස් පෙරේරා-2018.06.30.දක්වා හිගය-8342.95

2..කො.අ.09-ව.අ.177-යටියන්තොට පාර වම-ටී.එම් පියදාස-2018.06.30 දක්වා හිගය-5778.78

3.කො.අ.01-ව.අ.65/1-පරුස්සැල්ල පාර -සි.බි.පි.සේනානායක ඒ.ඒ.නෝනහාමි -2018.06.30.දක්වා හිගය-4410.14

4..කො.අ.01-ව.අ.65/3ඒ -පරුස්සැල්ල පාර -සි.බි.පි.සේනානායක ඒ.එෆ්.ජේ.වික්‍රමසිංහ-2018.06.30 දක්වා හිගය-3989.09

5..කො.අ.02-ව.අ.112/2-පරුස්සැල්ල පාර -බි.ඩබි.කරුණාරත්න 2018.06.30.දක්වා හිගය-3295.89
2018.06.30 දක්වා හිගයන්හි මුලු එකතුව- **104315.75**

2018.06.30 දක්වා හිගයන්හි මුලු එකතුව- **104315.75**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිමි

**(සභා තීරණ අංක 27)**

**ගරු සභාපතිතුමා**

(ඉ)28.විද්‍යුත් ලිපි ගොනු සැකසිම හා විද්‍යුත් සන්නිවේදනයට අදාළව භෞතික සැලසුම් කළමණාකරණ ඒකකයෙහි කර්මාන්ත ලිපි ගොනු විද්‍යුත් ලිපි ගොනු ලෙස සැකසිම හා විද්‍යුත් සන්නිවේදනය ව්‍යාප්තිය ක්‍රියාත්මක කිරිම සදහා වූ ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්, විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 28)**

**ගරු සභාපතිතුමා**

(ඉ)ගරු මන්ත්‍රීතමන්ලා /තුමියන්ලාගේ සංවර්ධන යෝජනා සම්මත කිරිම (රුපියල් ලක්ෂයේ ප්‍රතිපාදන මගින්)

| තිරණ අංකය | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රී තුමියගේ නම | වසම | යෝජනාව | ස්ථිර කිරිම |
|---|---|---|---|---|
| (ඉ)29 | එච්.ඒ.ඩි.ප්‍රසාදිකා මෙනවිය | මල්වත්ත | මිල්ලගොල්ල මාර්ගය කපා සකස් කර ගැනිම | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එන්.කේ නිමල්කුමාරසිරි මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය. |
